# 2022 වර්ෂයේ දී සිසු ඉගෙනුම් අවස්ථා අහිමිවීම ආවරණය සඳහා වන විශේෂ විෂය නිර්දේශය

## 07 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය - පළමු වාරය සඳහා

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

www.nie.lk

## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (**Recovery Plan for Learning Loss - 2022**)

### - 7 ශ්‍රේණිය

(7 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 9 ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 12ක් ද බැගින් කාලච්ඡේද 33 ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| **7 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | | |
| යුතුකම් හා වගකීම් ඉටු කිරීම මගින් පවුලේ සාමාජිකයන් අතර යහපත් අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි | සමාජයක කුඩා ම සහ වැදගත් ම ඒකකය පවුල බව හඳුනා ගෙන යහපත් සාමාජිකයකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩනගා ගැනීමට දායක වෙයි. | • පවුල යන සංකල්පය පැහැදිලි කරයි.<br>• තම පවුල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පවුල් වර්ගවල වෙනස්කම් පැහැදිලි කරයි.<br>• පවුලේ සාමාජිකයෙකු ලෙස තමා අත් විඳින ප්‍රයෝජන විස්තර කරයි. | • පවුල<br>• පවුල් වර්ග<br>• පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ<br>• පවුලේ සාමාජිකයකු වශයෙන් අපට ලැබෙන ප්‍රයෝජන | 7.1.1 | 01<br>අපේ පවුල<br><br>පෙළ පොතෙන් අවශ්‍ය කොටස තෝරා ගන්න | |
| | පවුලේ සාමාජිකයෙකු වශයෙන්, නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගෙන, ඒවා ඉටු කර ගැනීමට කටයුතු කරයි. | • නිවැරදි ජීවන අරමුණක් යන්න පැහැදිලි කරයි. | • සාර්ථක දිවි පෙවෙතකට අරමුණක් තිබීමේ වැදගත්කම සහ ඒ සඳහා ඵලදායීව යොමු වීම | 7.1.2 | | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | පවුලේ අනන්‍යතාව තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි. | • තමා පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීමේ වැදගත්කම<br>• පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංග | • තමා පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීමේ වැදගත්කම<br>• පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංග | 7.1.3 | | |
| | පවුලේ සාමාජිකයින්ගේ ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගි කර ගනිමින් අහිතකර බලවේගවලින් වැළකීමට කටයුතු කරයි. | • හිතකර බලවේග හා අහිතකර බලවේග විස්තර කරයි.<br>• හිතකර බලවේගවල ප්‍රතිඵල අගය කරයි.<br>• අහිතකර බලවේගවලින් ලැබෙන අහිතකර ප්‍රතිඵල විස්තර කරයි.<br>• අහිතකර බලවේගවලින් මිදීමේ උපාය මාර්ග පැහැදිලි කරයි. | • සමාජයක පවත්නා හිතකර, අහිතකර බලවේග හඳුනා ගැනීම.<br>• හිතකර බලවේග ජීවිතයට ළං කර ගැනීම හා අහිතකර බලවේගවලින් ඈත් වීමට කටයුතු කිරීම | 7.1.4 | | 01 |
| | පවුලේ සාමාජිකයන්ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • ක්‍රීඩාවෙන් හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලින් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>• පවුලේ සාමාජිකයින් සමග ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරතවන අයුරු විස්තර කරයි | • සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල පවත්නා අගය<br>• කාලය ඵලදායි ලෙස ගත කිරීම | 7.1..5 | | 01 |
| | පවුලේ සාමාජිකයකු වශයෙන් මුහුණපාන ගැටලු හා අභියෝග | • පවුලේ සමාජිකයෙකු ලෙස තමා මුහුණපාන ගැටලු හා අභියෝග විස්තර කරයි. | • එදිනෙදා ජීවිතයේ දී ඕනෑ ම පුද්ගලයෙකුට විවිධ අභියෝගවලට | 7.1.6 | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | හමුවේ, විචාරශීලී හා නිර්මාණශීලී චින්තනයෙන් යුතු ව කටයුතු කරයි. | • අභියෝග හමුවේ උපක්‍රමශීලී ව, නිර්මාණශීලී ව හා විචාරශීලී ව කටයුතු ආකාර පැහැදිලි කරයි.<br>• විවිධ චිත්තවේග නම් කරයි. | මුහුණ පෑමට සිදු වන බව<br>• චිත්තවේග පාලනයෙන් යුතු ව කටයුතු කිරීම හා එහි වැදගත්කම<br>• ජීවිත අවස්ථා හා අභියෝග හමුවේ උපක්‍රමශීලී ව මෙන් ම නිර්මාණශීලී ව හා විචාරශීලී ව කටයුතු කිරීම<br>• වෙනස් වන වෙළෙඳ පොළ තත්ත්ව හමුවේ විචාරශීලී ව හා බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම | | | 02 |
| | පවුලේ යහපැවැත්ම සඳහා වැඩ ලෝකයේ වැදගත්කම සහ පවුලේ ආදායම් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කර ගනියි. | • දිනපතා /සතිපතා/ මාසික ව හොඳ ආදායමක් ලැබීමේ හෝ අඩු ආදායමක් ලැබීමේ ප්‍රතිඵල සාකච්ඡා කරයි . | • පවුලකට මූල්‍යමය සුරක්ෂිතභාවයේ අවශ්‍යතාව | 7.1.7 | | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | පවුලේ සාමාජිකයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනයගරුක ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණධර්ම වර්ධනය කර ගනියි. | • පවුලෙන් තමා ට හා තමාගෙන් පවුලට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ප්‍රකාශ කරයි.<br>• අයිතිවාසිකම් භුක්ති විඳින අතරේ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• යහපත් පුරවැසියකු වීමට අවශ්‍ය ගුණාංග පවුල තුළින් ලැබෙන ආකාරය විස්තර කරයි. | • පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්<br>• පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියකු සතු විය යුතු ගුණාංග | 7.1.8 | | 01 |
| | පවුල හා අසල්වාසීන් අතර අන්‍යෝන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත් වීමට හුරු වෙයි. | • පවුලේ සාමාජිකයන් හා ඥාතිත්වය විස්තර කරයි.<br>• ඥාතිත්වය සඳහා විවිධ ප්‍රදේශවල භාවිත වන ඇමතුම් පද පිළිබඳසාකච්ඡා කරයි.<br>• අසල්වාසීන් සමග යහපත් සබඳතා ගොඩ නගා ගැනීම සමාජ පැවැත්මට අත්‍යවශ්‍ය බව පැහැදිලි කරයි. | • පවුලේ සාමාජිකයන් සහ ඥාතිත්වය<br>• තම සමීප ඥාතීන් හැඳින්වීම සඳහා භාවිත කරන ඇමතුම් පද<br>• පවුල තුළ ක්‍රියාත්මක වන සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා ඇගයීම් පද්ධතිය<br>• පවුල හා අසල්වාසීන් අතර පවත්නා සබඳතාවල වැදගත්කම | 7.1.9 | | 01 |
| එකතුව | | | | | | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | සමස්ත එකතුව | 33 |